# දත්ත සමුදාය විභාග අකෘති ඇගයීම් පත්‍රිකාව

- පහත වගුව සලකා බලා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

| NIC | Name | Food favorite | DeptID | Arrive or not |
|---|---|---|---|---|
| 887946512V | Sunil Rathnayaka | Chicken | SC0001 | Yes |
| 694125873V | Chandana Liyanage | Fish | SC0005 | No |
| 902145698V | Dinith Weerarathna | Vegetarian | MA0010 | Yes |

1. ප්‍රාථමික යතුර සඳහා යෝග්‍ය ක්ෂේත්‍රය (field) කුමක්ද?
   1. NIC (2) Name (3) Arrive or not (4) DeptID
2. ආගන්තුක යතුර (foreign key) සඳහා යෝග්‍ය ක්ෂේත්‍රය කුමක්ද?
   1. NIC (2) DeptID (3) Food favorite (4) Name
3. "Arrive or not" ක්ෂේත්‍රය සඳහා යෝග්‍ය දත්ත ප්‍රරූපය කුමක්ද?
   1. Text (2) Numeric (3) Boolean (4)Currency

4. පහත සඳහන් Marks (ලකුණු) සහ Subjects (විෂය) වගුව සලකා බලන්න

Marks වගුව

| Reg_Num | Subject_Code | Marks |
|---|---|---|
| 20005 | MA001 | 95 |
| 20006 | SC001 | 70 |
| 20007 | EG001 | 65 |
| 20005 | SC001 | 53 |

Subject වගුව

| Subject_Code | Subject_Name |
|---|---|
| MA001 | Mathematics |
| SC001 | Science |
| EG001 | English |

ඉහත Marks වගුව හා Subjects වගුව සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති අතුරෙන් අසත්‍ය -වගන්තිය කුමක්ද?

1. Marks වගුවේ පවතින Reg_Num හා Subject_Code යනු සංයුක්ත යතුරකි (composite key)
2. Marks වගුවේ පවතින Reg_Num ප්‍රාථමික යතුරකි (primary key)
3. Marks වගුවේ Subject_Code ආගන්තුක යතුරකි (foreign key)
4. Subjects වගුව හා Marks වගුව අතර එක - බහු (one - to - many) සම්බන්ධතාවක් පවතී

පහත ප්‍රශ්න සඳහා පහත දී ඇති ශිෂ්‍යයන්ගේ විෂය ලකුණු ආවයනය සඳහා භාවිත කර ඇති දත්ත සමුදා වගු පාදක කර ගන්න

ශිෂ්‍ය වගුව

| Student_No | Name | Class | Attendance |
|---|---|---|---|
| 17001 | Hiruja | 4A | Yes |
| 17002 | Pelaka | 4A | Yes |
| 17003 | Nimesh | 4B | No |
| 17004 | Naween | 4C | Yes |

විෂය වගුව

| Sub_Code | Subject |
|---|---|
| BUD_001 | Buddhism |
| ENG_001 | English |
| MA_001 | Mathematics |

ලකුණු වගුව

| Sub_Code | Student_No | Marks |
|---|---|---|
| BUD_001 | 17001 | 95 |
| ENG_001 | 17001 | 85 |
| BUD_001 | 17002 | 70 |
| MA_001 | 17004 | 65 |

5. විෂය වගුවෙහි ක්ෂේත්‍ර (fields) සංඛ්‍යාව කොපමණද?
   1. 2 (2) 3 (3) 4 (4) 6
6. ශිෂ්‍ය වගුව සඳහා ප්‍රාථමික යතුර (primary key) ලෙස වඩාත්ම යෝග්‍ය ක්ෂේත්‍රය කුමක්ද?
   1. Student_No (2) Name (3) Class (4) Attendance
7. දත්ත සමුදයෙහි ආගන්තුක යතුර (foreign key) සඳහා නිදසුන් වන්නේ කවරක්ද?
   1. විෂය වගුවෙහි Sub_Code (2) ලකුණු වගුවෙහි Sub_Code

   (3) ලකුණු වගුවෙහි Marks (4) ශිෂ්‍ය වගුවෙහි Attendance

8. ගණිතය (Mathematics) සඳහා නවීන් (Naween) ලබාගත් ලකුණු සංඛ්‍යාව කොපමණද?

   (1) 65 (2) 70 (3) 80 (4) 85

9. Microsoft Office Access දත්ත සමුදාය මෘදුකාංගය සම්බන්ධයෙන් පහත වගන්ති සලකා බලන්න

   A - වාර්තා පහසුවෙන් නිර්මාණය කිරීම සඳහා Report Wizard භාවිතා කෙරේ.

   B - එකිනෙක සම්බන්ධිත වගුවල දත්තවලින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා විමසුම(Query) භාවිතා කෙරේ.

   C - වගුවකට දත්ත ආදානය කිරීමට භාවිතා කෙරෙන්නේ ආකෘති පත්‍ර (Forms) වේ.

   ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක්ද?

   1. A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A,B හා C සියල්ලම

අංක 10 සිට 12 දක්වා ප්‍රශ්න පහත පෙන්වා ඇති දත්ත සමුදාය කොටස මත පාදක වී ඇත

Fruit Table (පලතුරු වගුව)

| EmpID | FriutID | SoldQuantity | Remain |
|---|---|---|---|
| GA0051 | MA0002 | 300 | 1700 |
| MA0054 | AP0001 | 200 | 500 |
| CO0056 | BA0003 | 400 | 1100 |
| KA0058 | AP0001 | 300 | 500 |

Rate Table (මිල ගණන් වගුව)

| FriutID | Name | Quantity |
|---|---|---|
| AP0001 | Apple | 1000 |
| MA0002 | Mango | 2000 |
| BA0003 | Banana | 1500 |

9. පලතුරු වගුවෙහි (Fruit Table) ප්‍රාථමික යතුර (primary key) ලෙස තෝරා ගැනීමට වඩාත් ම සුදුසු ක්ෂේත්‍රය කුමක් ද?

(1) EmpID (2) FriutID (3) SoldQuantity (4) Remain

10. පහත දැක්වෙන කුමන ක්ෂේත්‍රය (Field) දත්ත පාදකයෙහි ආගන්තුක (Foreign) යතුරක් සඳහා උදාහරණයක් වේද?

(1) පලතුරු වගුවෙහි EmpID (2) පලතුරු වගුවෙහි FriutID

(3) මිල ගණන් වගුවෙහි FriutID (4) පලතුරු වගුවෙහි SoldQuantity

11. මිල ගණන් වගුවෙහි තිබෙන ක්ෂේත්‍ර ගණන සහ රෙකෝඩ ගණන පිළිවෙලින්

(1) 2 සහ 2 වේ (2) 2 සහ 3 වේ (3) 3 සහ 2 වේ (4) 3 සහ 3 වේ

12 සිට 14 දක්වා ප්‍රශ්න පහත දත්ත සමුදාය මත පදනම් වී ඇත.

Post_Publisher Table

| PostID | UserID |
|---|---|
| PO111 | U0003 |
| PO112 | U0002 |
| PO113 | U0002 |
| PO114 | U0001 |

Post Table

| PostID | PostName | Like/Unlike |
|---|---|---|
| PO111 | Software Engineer | Like |
| PO112 | QA Engineer | Like |
| PO113 | DB Administrator | Unlike |
| PO114 | Business Analyst | Like |

User Table

| UserID | UserName | UserPhone | Address |
|---|---|---|---|
| U0001 | Ayu Widyarathna | +94717894562 | Mawanalla |
| U0002 | Dinith Weerarathna | +94761234568 | Matara |
| U0003 | Nipuna Liyanage | +94704567896 | Galle |
| U0004 | Lalith Perera | +94775623897 | Colombo |

12. User වගුවේ ඇති UserPhone සඳහා වඩාත්ම යෝග්‍ය වන දත්ත ප්‍රරූපය (data type) කුමක්ද?

(1) Currency (2) Data (3) Number (4) Text

13. User වගුවේ ප්‍රාථමික යතුර (Primary Key) සඳහා වඩාත්ම යෝග්‍ය වන්නේ පහත සඳහන් කවරක්ද?

(1) UserID (2) UserName (3) UserPhone (4) Address

14. ආගන්තුක යතුරකට (Foreign Key) උදාහරණයක් වන්නේ පහත සඳහන් කවර ක්ෂේත්‍රයක්ද?

(1) User වගුවේ UserName (2) Post_Publisher වගුවේ UserID

(3) User වගුවේ UserPhone (4) Post වගුවේ PostName

15. සංගීත භාණ්ඩ වන වයලීන්,බටනලා ,ගිටාර් , සර්පිනා සහ බෙර විකුණන වෙළෙඳසැලක ඇති දත්ත සමුදා වගුවක් සමන්විත වන්නේ විකිණීමට ඇති සංගීත භාණ්ඩ පිලිබඳ දත්තවලින්ය.වගුවේ ඇති එක් සංගීත භාණ්ඩයක් සම්බන්ධ දත්ත හැඳින්විය හැක්කේ,

(1) ක්ෂේත්‍රයක් (field) ලෙසය (2) ආගන්තුක යතුරක් (foreign key) ලෙසය

(3) ෆෝරමයක් (form) ලෙසය (4) රෙකෝඩයක් (record) ලෙසය

16. ලී බඩු විකුණනු ලබන වෙළෙඳසැලකට සැපයුම්කරුවන් බොහෝ සංඛ්‍යාවක් සිටී.එක් එක් සැපයුම්කරුට ලී බඩු අයිතම කිහිපයක් සැපයිය හැකිය.විකිණීම සඳහා ඇති ලී බඩු අයිතමවල දත්ත අඩංගු දත්ත සමුදා වගුවක් සඳහා ප්‍රාථමික යතුර ලෙස වඩාත් සුදුසු වන්නේ පහත සඳහන් ඇ අතුරෙන් කවරක්ද?

(1) භාණ්ඩයේ කේත අංකය (2) මිල

(3) ප්‍රමාණය (4) සැපයුම්කරුවන්ගේ කේත අංකය

17.සම්බන්ධතා දත්ත සමුදායක (relational database) පවත්නා සම්බන්ධතාවන් පිළිබඳව පහත සඳහන් කුමක් නිවැරදි වන්නේද?

(1) සම්බන්ධතාවක් යනු එකිනෙකට සම්බන්ධිත වගු එකතුවකි.

(2) සම්බන්ධතාවක් යනු රෙකෝඩවල එකතුවකි.

(3) සම්බන්ධතාවක් යනු ක්ෂේත්‍ර කිහිපයක එකතුවකි

(4) සම්බන්ධතාවක් යනු දත්ත සමුදා දෙකක් අතර සංසට්ටනයයි

ප්‍රශ්න අංක 18 හා 19 ට පිළිතුරු දීම සඳහා පරිගණක උපාංග අලෙවිසැලක් භාවිත කරන පහත දැක්වෙන දත්ත සමුදාය වගුව සලකන්න

| ItemID | ItemName | Quantity | UnitPrice |
|---|---|---|---|
| CD001 | CD | 100 | 50 |
| RAM002 | RAM | 50 | 7000 |
| HD003 | Hard Disk | 30 | 10000 |

19. ප්‍රාථමික යතුර (Primary Key) සඳහා සුදුසු ක්ෂේත්‍රය (field) වන්නේ,

(1) Quantity (2) ItemName (3) ItemID (3) UnitPrice

20. වගුවේ ඇති ක්ෂේත්‍ර ගණන කොපමණද?

(1) 1 (2) 3 (3) 4 (4) 12

21-23 ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට පහත තොරතුරු ඇතුළත් කර ඇති වගු කොටස භාවිත කරන්න.

| ItemID | Name | Quantity |
|---|---|---|
| Ins2020-01 | Drum | 10 |
| Ins2020-02 | Violin | 8 |
| Ins2020-03 | Guitar | 5 |
| Ins2020-04 | Organ | 7 |

1.දී ඇති වගු කොටසේ ගබඩා කර ඇති රෙකෝඩ (records) සංඛ්‍යාව කීයද?

(1) 2 (2) 3 (3) 4 (4) 6

22. දී ඇති වගු කොටසේ දත්ත ගබඩා කිරීම සඳහා කොපමණ ක්ෂේත්‍ර (fields) සංඛ්‍යාවක් භාවිත කර තිබේද?

(1) (2) 3 (3) 4 (4) 6

23. 'ItemID' සඳහා වඩාත්ම යෝග්‍ය දත්ත ප්‍රරූපය (data type) කුමක්ද?

(1) මිල (currency) (2) දින/කාලය (date/time)

(3) සංඛ්‍යාත්මක (numeric) (4) පාඨ (text)

24. දත්ත සමුදාය වගුවක 'ප්‍රාථමික යතුර' (Primary key), සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත සඳහන් ඇ අතුරෙන් කවරක්ද?

(1) ප්‍රාථමික යතුර හිස් නොවිය යුතුය.

(2) ප්‍රාථමික යතුරෙහි අනුපිටපත් පවතී.

(3) ප්‍රාථමික යතුර මගින් වගු දෙකක් අතර සම්බන්ධතාව ගොඩනගයි.

(4) ප්‍රාථමික යතුර අනන්‍ය (unique) නොවිය යුතුය.

25. දත්ත අනුපිටපත් වීමෙන් (data duplication) ඇතිවන අවාසියක් නොවන්නේ,

(1) නිවැරදිව දත්ත විශ්ලේෂණය කිරීමට නොහැකි වීම.

(2) දත්ත සමුදායේ කාර්යක්ෂමතාව වැඩි වීම.

(3) දෝෂ සහිත තොරතුරු ලැබීමට ඇති හැකියාව වැඩි වීම.

(4) දත්ත ආදානය කිරීම අපහසු වීම.

26. ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායක වාසියක් නොවන්නේ,

(1) තොරතුරු සෙවීම වැඩ කාර්යක්ෂම වීම.

(2) උපස්ථ පිටපත් ලබා ගැනීමට පහසු වීම.

(3) දත්ත තැන්පත් කිරීමට ඉතා අඩු අවයන ධාරිතාවක් වැයවීම.

(4) දත්ත හවුලේ භාවිතා කිරීමට නොහැකිවීම.

27. Microsoft office Access මෘදුකාංගය මගින් එකිනෙකට සම්බන්ධිත වගුවල දත්ත වලින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා,

(1) දත්ත ආකෘති පත්‍ර(Forms) භාවිතා කරයි. (2) වාර්තා (Reports) භාවිතා කරයි.

(3) විමසුම්(Query) භාවිතා කරයි. (4) සම්බන්ධිත වගු භාවිතා කරයි.

28-30 ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට පහත තොරතුරු ඇතුළත් කර ඇති වගු කොටස භාවිත කරන්න.

| StudentID | ItemID | ItemName | Borrowed |
|---|---|---|---|
| S202001 | I0001 | Violin | Yes |
| S202002 | I0002 | Guitar | No |
| S202003 | I0001 | Violin | No |
| S202004 | I0003 | Drum | Yes |

28. ප්‍රාථමික යතුර සඳහා අදාළ ක්ෂේත්‍රය වන්නේ,

(1) Borrowed (2) ItemID (3) StudentID (4) ItemName

29. ආගන්තුක යතුර සඳහා අදාළ ක්ෂේත්‍රය වන්නේ,

(1) StudentID (2) ItemName (3) Borrowed (4) ItemID

30. වගුවේ අඩංගු රෙකෝඩ (records) ගණන හා ක්ෂේත්‍ර (Fields) ගණන වන්නේ,

(1) 3, 4 (2) 3, 3 (3) 4, 4 (5) 3, 4

## දෙවන කොටස

1. වෙළෙඳසැලක අයිතම සහ පාරිභෝගිකයන් පහත පෙන්වා ඇති දත්ත සමුදා වගු මගින් ඉදිරිපත් කර ඇත.

පාරිභෝගික_දත්ත වගුව (Consumable Table)

| EmpName | ItemID | StoreID |
|---|---|---|
| S.A. Jayalal | R0001 | A0001 |
| M.M. Mharoof | T0002 | B0002 |
| R. Puvanendran | M0003 | A0001 |
| T.B. Silva | R0001 | B0002 |

අයිතම වගුව (Item Table)

| ItemID | ItemName | UnitPrice |
|---|---|---|
| R0001 | Radio | 1200 |
| T0002 | Tourch | 350 |
| M0003 | Wire Code (5m) | 750 |
| I0004 | Iron | 1150 |

ගබඩා වගුව (Store Table)

| StoreID | StoreName |
|---|---|
| A0001 | Aluthgama |
| B0002 | Beruwala |

i. ප්‍රාථමික (primary) යතුරු දෙකක් ඒවාට අදාළ වගු සමග ලියා දක්වන්න.

ii. ආගන්තුක (foreign) යතුරු දෙකක් ඒවාට අදාළ වගු සමග ලියා දක්වන්න.

iii. *ගබඩාවේ ඇති ප්‍රමාණය (StoreQuantity)* යන ක්ෂේත්‍රය ඇතුළත් කිරීමට වඩාත්ම යෝග්‍ය වගුව කුමක්ද?

iv. *Stand Fan නම් නව අයිතමයක් M.M. Samuel විසින් StoreID = B0002 ට එකතු කරන්නේ නම් යාවත්කාලීන කළ යුතු වගු මොනවාද?*

v. ඉහත (iv) කොටසෙන් ලැබුණු යාවත්කාලීන කිරීම් සඳහා අදාළ වගුවල යාවත්කාලීන වූ පේළි සහ ඒවාට අදාළ වගු නාම ලියා දක්වන (ItemID = SF0005 හා UnitPrice = 12000 ලෙස උපකල්පනය කරන්න)

vi. "S.A. Jayalal" ගේ සම්පූර්ණ තොරතුරු *විමසුමක්* මගින් ලබගනීනම් ඒ සඳහා සම්බන්ධ කළ යුතු වගු මොනවාද?

2. එක්තරා පාසලක ක්‍රීඩා කණ්ඩායම සතුව ක්‍රීඩා භාණ්ඩවල එකතුවක් තිබෙන අතර ළමුන්ට පුහුණු වීමට එම ක්‍රීඩා භාණ්ඩ ලබා දීම කළමනාකරණය සඳහා ක්‍රීඩා සංගමය විසින් දත්ත සමුදායක් (Database) නඩත්තු කරයි.එම දත්ත සමුදාය පහත දැක්වෙන වගුවලින් සමන්විත වේ.

| SP_ID | SportItem (භාණ්ඩය) | Receive_Date (ලැබුණු දිනය) |
|---|---|---|
| SP0001 | Volley Ball | 01/03/2020 |
| SP0002 | Net Ball | 05/05/2020 |
| SP0003 | Bat | 01/07/2020 |
| SP0004 | Bat | 10/07/2020 |

ක්‍රීඩා භාණ්ඩ වගුව (SportItem Table)

| Date | SP_ID | S_ID |
|---|---|---|
| 01/12/2019 | SP0001 | S0003 |
| 05/01/2020 | SP0003 | S0001 |
| 01/01/2020 | SP0002 | S0003 |
| 30/01/2020 | SP0001 | S0003 |

ලබාගන්නාවූ වගුව (Borrowing Table )

ශිෂ්‍ය වගුව (Student Table)

| S_ID | Name | Grade |
|---|---|---|
| S0001 | Dimuthu | 8 |
| S0002 | Punsala | 11 |
| S0003 | Sandun | 9 |

i. ඉහත දත්ත සමුදායේ ප්‍රාථමික යතුරු (primary key) දෙකක් ඒවායේ වගුවල නම් ද සමග ලැයිස්තුගත කරන්න.

ii. 2020 අගෝස්තු 01 වැනි දින පාසලට පරිත්‍යාගයක් ලෙස Badminton Racket යුගල් දෙකක් ලැබුණි.

a. දත්ත සමුදායෙහි කුමන වගුව/වගු යාවත්කාලීන කළ යුතු වන්නේද?

b. දත්ත සමුදායෙහි වගුවෙහි/වගුවල යාවත්කාලීන කරන ලද පේළි(Rows) ලියා දක්වන්න.

iii. 2020 අගෝස්තු මස 21 වැනි දින 9 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන (Jithmini)ජිත්මිනී අත්පන්දු (Volley Ball) කණ්ඩායමට බැඳෙන අතර, එදිනම ඇය අත්පන්දුවක් (Volley Ball) ලබා ගනී.

a. දත්ත සමුදායෙහි කුමන වගුව/වගු යාවත්කාලීන කළ යුතු වන්නේද?

b. දත්ත සමුදායෙහි වගුවෙහි/වගුවල යාවත්කාලීන කරන ලද පේළි(Rows) ලියා දක්වන්න.